1st Place Winner
National Productivity
Award 2020

ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. CSS/02/16/Circular new | ඔබේ අංකය / உமது இல / Your Ref. | දිනය / திகதி / Date 2026.05.18 |

දකුණු පළාත් සභාවේ සියළුම ආයතන ප්‍රධානීන්,

**<u>පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ ඒ ආකාරයේ අනෙකුත් ක්‍රියාකාරකම් මෙහෙයවන සම්පත්දායකයින්ට දීමනා ගෙවීම</u>**

උක්ත කරුණ සම්බන්ධව දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් විසින් යොමු කරන ලද අංක GS/SP/1/1/01/01 හා 2026.05.16 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, රජයේ නිලධරයන් සඳහා පවත්වනු ලබන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ එවැනි ආකාරයේ වෙනත් වැඩසටහන් වලදී සම්පත්දායකත්වය ලබා දෙන සම්පත්දායකයින් සඳහා දීමනා ගෙවීම සඳහා සකස් කරනු ලැබූ දකුණු පළාත් ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) චක්‍රලේඛ අංක 01/2026, දකුණු පළාත් සභාවට අනුගත කර ගැනීම සඳහා 2026.05.15 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලැබී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/SP/1/1/01/01 හා 2026.05.16 දිනැති ලිපිය මඟින් දන්වා ඇති බව කාරුණිකව දන්වමි.

චන්දිම සී. මුහන්දිරම්ගේ,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

1st Place Winner
National Productivity
Award 2020

ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/02/16/Circular new | ඔබේ අංකය<br>உமது இல<br>Your Ref. | දිනය<br>திகதி<br>Date 2026.05.18 |

ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) චක්‍රලේඛ 01/2026

දකුණු පළාත් සභාවේ සියළුම ආයතන ප්‍රධානීන්,

**<u>පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ ඒ ආකාරයේ අනෙකුත් ක්‍රියාකාරකම් මෙහෙයවන සම්පත්දායකයින්ට දීමනා ගෙවීම</u>**

රජයේ නිලධරයන් සඳහා පවත්වනු ලබන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ එවැනි ආකාරයේ වෙනත් වැඩසටහන් වලදී සම්පත්දායකත්වය ලබා දෙන සම්පත්දායකයින් සඳහා දීමනා ගෙවීම පොදු ක්‍රමවේදයකට අනුව සිදු කිරීම අරමුණු කර ගනිමින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2025 චක්‍රලේඛය 2025.03.01 දින සිට හා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් මඟින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් වැනි අනෙකුත් ක්‍රියාකාරකම් වෙනුවෙන් සම්පත්දායකත්වය ලබා දෙන සම්පත්දායකයින් සඳහා දීමනා ගෙවීම පොදු ක්‍රමවේදයකට අනුව සිදු කිරීම අරමුණු කර ගනිමින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ 10/2025 චක්‍රලේඛය 2025.11.01 දින සිට බලපැවැත්වෙන පරිදි දකුණු පළාත් සභාවට අනුගත කර ගනු ලැබේ.

02. ඒ අනුව, දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය හා පහත 03 ඡේදයේ සඳහන් ව්‍යවස්ථාපිත ආයතනයන් මඟින් මෙහෙයවනු ලබන පුහුණු වැඩසටහන් හැර දකුණු පළාත් සභාවේ ක්‍රියාත්මක වන අනෙක් සියලුම පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ හා ඒ ආකාරයේ අනෙකුත් ක්‍රියාකාරකම් මෙහෙයවන සම්පත්දායකයන්ට දීමනා ගෙවීම සම්බන්ධව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2025 චක්‍රලේඛය ඒ ආකාරයෙන්ම දකුණු පළාත් සභාව සඳහා අනුගත කර ගත යුතුය.

03. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් මඟින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් වැනි අනෙකුත් ක්‍රියාකාරකම් මෙහෙයවන සම්පත්දායකයන්ට දීමනා ගෙවීම සම්බන්ධව මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති කළමනාකරණ සේවා චක්‍රලේඛ 10/2025 චක්‍රලේඛය දකුණු පළාත් සභාවේ ව්‍යවස්ථාපිත ආයතන සඳහා අදාළ කර ගත යුතුය.

04. දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය මඟින් මෙහෙයවනු ලබන පුහුණු වැඩසටහන් හා උක්ත චක්‍රලේඛ දෙකෙහි සඳහන් නොවන පරිබාහිරව පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා, දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනයේ සම්පත් දායක දීමනා සහ අනෙකුත්

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

කාර්ය මණ්ඩල දීමනා හා ඇගයීම් දීමනා ගෙවීම සම්බන්ධව තත්කාලීනව බලපැවැත්වෙන අනුමැතිය ප්‍රකාරව ගෙවීම් කටයුතු සිදු කළ යුතුය.

චන්දිම සී. මුහන්දිරම්ගේ,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

චන්දිම සී. මුහන්දිරම්ගේ
ප්‍රධාන ලේකම්
දකුණු පළාත